**සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවේ 2020 අප්‍රේල් 01 දින සිට 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ තුනක කාල පරිච්ඡේදය සඳහා වූ ගනුදෙනු පිළිබඳ වාර්තාව**

---

සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවේ (“සමාගම”) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ 03ක කාල පරිච්ඡේදය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 අප්‍රේල් 01 දින සිට 2023 මාර්තු 31 දින දක්වා වූ වර්ෂ 7කට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තියට අනුව, ශේෂ පත්‍රයේ දින සිට මාස හයක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අය විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.

**2.1 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

සමාගම විසින් අවසන් වරට පිළියෙල කර විගණනය කරන ලද 2011 මාර්තු 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අයිතමය** | **මුදල රු.** |
|---|---|
| ජංගම නොවන වත්කම් | 91,269,967 |
| ජංගම වත්කම් | 832,852,873 |
| | --------------- |
| මුළු වත්කම් | 924,122,840 |
| | ========== |
| ජංගම බැරකම් | 45,828,678 |
| ජංගම නොවන බැරකම් | 929,570,102 |
| | --------------- |
| මුළු බැරකම් | 975,398,780 |
| ශුද්ධ වත්කම් / අයිතිය | (51,275,940) |
| | ----------------- |
| මුළු හිමිකම් හා බැරකම් | 924,122,840 |
| | ========== |
| මුළු ආදායම | 75,166,023 |
| මුළු වියදම | 77,894,846 |
| | --------------- |
| ඌනතාවය | (2,728,823) |
| | ========== |

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මූල්‍ය කටයුතු**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2010 ජූලි 01 දිනැති අංක PE/GOCO/TR-9 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් වසරක කාල සීමාවක් සඳහා පත්කළ නිසි බලධාරියා 2022 නොවැම්බර් 30 දක්වා රාජකාරී ඉටු කර තිබුණ ද එම නිලධාරියාගේ පත්වීම් දීර්ඝ කර තිබුනේ 2023 ජූලි 25 දිනැති අංක අමප /23/1151/616/025 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් වේ. එසේම ඉටු කළ යුතු කාර්යයන් පිළිබඳව ලිඛිත රාජකාරී පැවරුමක්ද නොමැතිව නිලධාරියා විසින් කටයුතු කර තිබුණි. | 2011.07.01 දින සිට 2022.11.30 දින දක්වා හිටපු නිසි බලධාරීට අදාළව නිසි බලධාරී පත්වීම නියමානුකූල කිරීමට කටයුතු කිරීමට සහ 2022.12.01 දින සිට නව නිසි බලධාරී පත් කිරීමට අදාළව 2023.01.31 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී ඇත. | 2010 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රාජකාරී කල නිසි බලධාරීගේ පත්වීමට අදාළ සම්පූර්ණ කාලයම නියමානුකූල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක අමප/22/2180/616/034 හා 2023 ජනවාරි 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මාස 06ක කාලයක් තුළ සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව ඇවර කිරීමට | නිසි බලධාරීගේ කාල සීමාව දීර්ඝ කිරීම සහ ඇවර කටයුතු සිදු කිරීම සඳහා ඇවරකරු පත්කිරීමට අනුමැතිය ඉල්ලා 2023.07.26 | අංක අමප23/1428/616/025-1 හා 2023 සැප්තැම්බර් 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ |

| | | | |
|---|---|---|---|
| | යටත්ව 2022 දෙසැම්බර් 01 දින සිට බලාත්මක වන පරිදි නිසි බලධාරියෙකු පත්කර තිබුණු නමුත් එම කාලසීමාව ඉක්මවා වසරකට වැඩි කාලයක් ගත වී තිබුණද සංස්ථාව ඈවර කිරීමේ කටයුතු මෙතෙක් අවසන් කර නොතිබුණි. | දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ අතර ඒ සඳහා අංක අමප/23/1428/616/025-1 හා 2023.09.12 දිනැතිව අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත. | මගින් 2023 ජූලි 01 සිට මාස 4 ක කාලයක් සඳහා පමණක් කාලය දීර්ඝ කිරීමක් ලබා දී තිබූ නමුත් 2024 මාර්තු 31 දක්වාම ඈවර කිරීම අවසන් කර නොතිබුණු අතර ඈවර කිරීම කඩිනමින් අවසන් කල යුතුය. |
| (ඇ) | රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තශාලා ඇති කර කුඩා රබර් වතු හිමියන්ට සහන සැලසීම සඳහා 1999 වර්ෂයේදී හා 2001 වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් මෙම සමාගමට ලබාදී තිබූ උප ණය මුදලින් 2023 මාර්තු 31 දිනට උපචිත උප ණය මුදල රු.මිලියන 766.74 ක් හා උපචිත පොළිය රු.මිලියන 612.80 ක් වුවද වගකීම් පියවීමට ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව සුදුසු ආයෝජකයෙකුට බදුදීමටත් එහි යන්ත්‍ර සූත්‍ර අලෙවි කිරීමටත් 2019 අප්‍රේල් 24 දිනැති අංක අමප/19/0985/117/031 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇතත්, එම උපදෙස් ක්‍රියාත්මක කර ඉහත උප ණය ඇතුළු සංස්ථාවේ වගකීම් පියවීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. | එම අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුවද රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්ත ශාලාවට අදාළව නව තක්සේරු වාර්තාවක් ලබා ගන්නා ලදී. එම තක්සේරු වාර්තාව මඟින්ද අදාළ යන්ත්‍ර සූත්‍ර වල අඩංගු ලෝහ වර්ග වෙන් වෙන් වශයෙන් වෙන් නොකිරීම සහ බර සඳහන් කර නොතිබීම නිසා කාර්යය සිදු කිරීමට තාක්ෂණික හැකියාවක් පවතින ලංකා කාර්මික මණ්ඩලය වෙත ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්ත ශාලාවට අදාළ යන්ත්‍ර සූත්‍ර වෙන්දේසි කර විකිණීමේ සම්පූර්ණ කාර්යයම පවරා අදාළ යන්ත්‍ර සූත්‍ර විකිණීමෙන් ලද මුදල් උප ණය පියවීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පැවතීම. | යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අප්‍රමාදව වගකීම් පියවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සංස්ථාවේ ලිපිලේඛන පවත්වාගෙන යාම, ආරක්ෂක සේවා හා නිසි බලධාරියාගේ දීමනාව ඇතුළු මෙහෙයුම් වියදම් සඳහා මසකට රු.100,000 ක පමණ වියදමක් වැය වෙන බව ඇස්තමේන්තු කර තිබූ අතර, එය භාණ්ඩාගාරය විසින් අයකරනු ලබන බදු කුලියෙන් ලබා දීමට 2017 අගෝස්තු මාසයේ සිට එකඟවී තිබුණි. මෙම දීමනාව 2020 ජූලි මාසය දක්වා පමණක් ලබා දී තිබුණු අතර පසුව වහරක කර්මාන්ත මාසික බදු කුලිය වූ රු.85,000ක ශාලාවේ බදු ආදායමෙන් සංස්ථාවේ මෙහෙයුම් වියදම් කර තිබුණි. | මෙම අමාත්‍යාංශය සතුව මුදල් ප්‍රතිපාදන නොමැති නිසා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා ගැනීමට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත 2022.07.18 ලිඛිතව ඉල්ලීමක් කර ඇත. මීට අමතරව මේ සම්බන්ධව 2022.10.26 දිනැති ලිපිය මඟින් හා 2022.11.10 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පැවති සාකච්ඡාවේදී ලබා දෙන ලද උපදෙස් අනුව 2022.11.14 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතද ලිඛිතව දැනුම් දී ඇත. | අමාත්‍යාංශය විසින් එකඟ වී ඇති පරිදි සංස්ථාවේ මෙහෙයුම් වියදම් පියවා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2020 අප්‍රේල් 01 සිට 2023 ජනවාරි 31 දක්වා විගණනය වෙත ලබා දී තිබූ බැංකු ප්‍රකාශන අනුව සංස්ථාවේ ජංගම ගිණුමේ අයිරාවක් පැවැති අවස්ථාද තිබුණු අතර ඒ සඳහා රු.5,030 ක අයිරා පොලී සහ රු.10,000 ක බැංකු ගාස්තු ද දරා තිබුණි. | එකඟ වේ. | රාජ්‍ය බැංකු ගිණුම් මගින් අයිරා පහසුකම් මත ගෙවීම් කිරීමට කටයුතු නොකළ යුතුය. |

**3.2 මෙහෙයුම් කටයුතු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව සතු කර්මාන්තශාලා 06 න් 04ක් බදු දී තිබුණු අතර එයින් එක් කර්මාන්තශාලාවක් බුදල් නඩුවක් මාර්ගයෙන් ඉඩමේ අයිතිකරු විසින් පවරා ගෙන තිබුණි. අනෙක් කර්මාන්තශාලාව වන ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව සුදුසු ආයෝජකයෙකුට බදු දීමට හා එහි යන්ත්‍ර සූත්‍ර ඇතුළු වත්කම් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කර විකිණීමට 2016 නොවැම්බර් 09 ,2019 අප්‍රේල් 24 හා 2023 මාර්තු 08 දිනැති පිලිවෙළින් අංක අමප/16/1902/726/041, අමප/19/0985/117/031 හා අංක අමප/23/0225/616/006 දරන අමාත්‍ය මණ්ඩල තීරණ මගින් අනුමැතිය ලබා දී තිබුණද වසර 7කට වැඩි කාලයක් ගත වුවද එම කාර්යයන් මේ දක්වා ඉටුකර නොතිබුණි. | කර්මාන්තශාලාව පිහිටි ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු බැවින් ඉඩම් සහ එහි පිහිටි කර්මාන්තශාලාව වසර 30 ක කාලයකට බදු දීම පිළිබඳව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් එකඟතාවය ලබා ගැනීමට ඉල්ලීමක් කළද ඒ සඳහා එකඟතාවය පළ නොකරන ලද බැවින් එම අවස්ථාවේදී බදු දීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එසේම යන්ත්‍ර සූත්‍ර සඳහා තක්සේරුවක් ඉදිරිපත්කර නොමැති බැවින් අදාළ යන්ත්‍ර සූත්‍ර වෙන්දේසි කිරීමට නොහැකි විය. | අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි යන්ත්‍ර සූත්‍ර තක්සේරු කර ප්‍රසම්පාදන ක්‍රමවේද මගින් අලෙවි කිරීමටත් කර්මාන්ත ශාලාව බදු දීමටත් කඩිනමින් පියවර ගත යුතුය. |
| (ආ) | විගණනය වෙත ලද තොරතුරු අනුව ඇරෝමා නැචුරල් රබර් (පුද්) සමාගම වෙත බදු දී තිබුණු මාවනැල්ල කේන්ද්‍ර අපසාරී,මාවනැල්ල ටයර් ටියුබ් හා බදුරලිය ක්‍රේප් රබර් කර්මාන්තශාලා තුනෙන් වර්තමානය වන විට බදු මුදල් ගෙවනු ලබන්නේ මාවනැල්ල ටයර් ටියුබ් හා බදුරලිය ක්‍රේප් රබර් යන කර්මාන්තශාලා දෙක පමණක් වන අතර බදු ගිවිසුම් කොන්දේසි අංක 05 අනුව 2021 මාර්තු 14 සිට වැඩි විය යුතු බදු කුලිය අයකරගෙන තිබුණ ද 2017 මාර්තු 13 දින සිට 2021 මාර්තු 13 දක්වා කාලය සඳහා වැඩි වූ බදු කුලිය එනම් රු.3,908,016ක් අයකරගෙන නොතිබුණි. එසේම 2020 අප්‍රේල් සිට 2021 මාර්තු දක්වා මෙම කර්මාන්තශාලා දෙකෙහි අය වූ බදු කුලිය සම්බන්ධ විස්තරද විගණනයට ඉදිරිපත් නොවුණි. | ප්‍රමාණවත් තොරතුරු නොමැත. | බදු ගිවිසුම් ප්‍රකාරව බදු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර විගණනයට අවශ්‍ය තොරතුරු නිසි පරිදි ලබා දිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2016 නොවැම්බර් 09 දිනැති අමප/16/1902/726/041 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව විසින් බදු දී තිබුණු ඉහත 3.2(ආ) හි සඳහන් කර්මාන්තශාලා 03හි බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වුව ද බදු අදායම් එකතු කිරීමේ කටයුතු එම අමාත්‍යාංශය මගින් සිදු නොකරන බැවින් ඒ පිළිබඳ තොරතුරු ද අමාත්‍යාංශය සතුව නොමැති බව විගණනයට දන්වා තිබුණි. | ප්‍රමාණවත් තොරතුරු නොමැත. | සංස්ථාව හා අමාත්‍යාංශය විසින් බදු කුලී ආදායම් එකතු කිරීම පිළබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාමට හා අධීක්ෂණයට කටයුතු කළ යුතු බව. |
| (ඈ) 2022 පෙබරවාරි 02 දිනැති අංක TPD/A/PED/02/2022/17 දරන ලිපිය මගින් 2021 දෙසැම්බර් 31 දිනට කර්මාන්තශාලා 04කින් බදු මුදල් අයවීම් හා හිඟහිටි බදුකුලී ආදායම පිළිබඳ තොරතුරු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් විමසා තිබුණු නමුත් එම තොරතුරු 2023 දෙසැම්බර් 31 දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රමාණවත් තොරතුරු නොමැත. | බදු මුදල් අයවීම් හා හිඟ හිටි බදුකුලී පිළිබඳ තොරතුරු යාවත්කාලීන පවත්වා ගැනීමට හා විගණනයට අවශ්‍ය තොරතුරු ලබා දීමට සමාගම විසින් කටයුතු කළ යුතුය. |
| (ඉ) මාවනැල්ල කේන්ද්‍ර අපසාරි කර්මාන්ත ශාලාවේ කඩා වැටී ඇති ප්‍රධාන ගොඩනැඟිලි වහලය ප්‍රතිසංස්කරණය කර නොදීම හේතුවෙන් බදු ගැනුම්කරු විසින් 2018 ජූලි සිට බදු කුලී ගෙවා නොතිබුණු අතර 2018 ජුනි දක්වා ගෙවූ බදු කුලිය තුළද එම වර්ෂයේ වැඩි වූ බදු කුලියද ගෙවීම් කර නොතිබුණි. ඒ අනුව අයවිය යුතු මුළු හිඟ බදු කුලිය රු.44,869,590ක් වූ අතර වසර 05කට වැඩි වුවද ප්‍රතිසංස්කරණ කටයුතුද අවසන් කර නොතිබුණි. | එකඟ වේ. | කර්මාන්තශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර නියමිත බදු කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඊ) 2014 වර්ෂයේ සිට පවතින බදු ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණු අතර බදු ගිවිසුම්වල 5 වන වගන්තිය පරිදි බදු ගැණුම්කරුගේ කොන්දේසි xi ප්‍රකාරව බදු ගැනුම්කරු විසින් ගොඩනැගිලි හා අනෙකුත් ස්ථිර ඉදිකිරීම්ද ඇතුළුව සියලු අවදානම් රක්ෂණය කළ යුතු නමුත්, එසේ සිදුකර නොතිබුණි. | එකඟ වේ. | බදු ගිවිසුම් යාවත්කාලීන කිරීමට හා එහි වගන්ති ප්‍රකාරව ගිවිසුම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (උ) වහරක ක්‍රේප් රබර් කර්මාන්ත ශාලාව සී/ස රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව විසින් 2011 පෙබරවාරි 01 සිට 2026 ජනවාරි 31 දක්වා වසර 15ක් සඳහා පුද්ගලික සමාගමකට බදු පදනම මත ලබා දී තිබුණු නමුත් මෙම සමාගම විසින් 2021 වර්ෂයේදී කර්මාන්තශාලාව අතහැර දමා ගොස් තිබුණි. එම පුද්ගලික සමාගම වෙතින් තව | එකඟ වේ. | බදු ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු බදු කුලී හා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. බදු ගිවිසුම්වල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |

| | | |
|---|---|---|
| දුරටත් අයවිය යුතු බදු මුදල් හා ගිවිසුමේ 9 වන වගන්තිය ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර තිබුණේද ආදී විස්තර විගණනයට ඉදිරිපත් නොවීය. තවද 2021 අගෝස්තු 01 සිට 2026 ජනවාරි 31 දක්වා රු.85,000ක මාසික කුලියට යථෝක්ත කර්මාන්ත ශාලාව වෙනත් පෞද්ගලික සමාගමකට නැවත බදු දී තිබුණු නමුත් එම සමාගම සමග එළැඹි බදු ගිවිසුමෙහි මුල් පිටපත විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඌ) සමාගම සතු කර්මාන්තශාලා තුන බදු දෙනු ලබන අවස්ථාවේ දී බදු ගැනුම්කරුවන්ට භාරදුන් ඉන්වෙන්ට්‍රිගත වත්කම් පිළිබඳ ලේඛන හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකිරීම නිසා බදු ලබා දුන් වත්කම් පිළිබඳ විස්තර සහ එම වත්කම්වල පැවැත්ම පිළිබඳ විගණනයට සහතික කර ගැනීමට නොහැකි විය. | කරුණු සොයා ගත නොහැකි වී ඇත. | බදු දී ඇති වත්කම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (එ) දොඩම්ගොඩ මෝල්ඩඩ් කර්මාන්තශාලාව, බූදල් නඩුවක් මාර්ගයෙන් අදාළ කර්මාන්තශාලාව පිහිටි ඉඩමේ අයිතිකරු විසින් පවරා ගැනීමට කටයුතු කර ඇති බව අමාත්‍යාංශයේ ලිපි ලේඛන පරීක්ෂාවේ දී අනාවරණය වුවද මේ බව තහවුරු කර ගැනීම සඳහා අදාළ නඩුතීන්දුවේ පිටපතක් හා අදාළ ලියවිලි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම මෙම කර්මාන්තශාලාව සතුව තිබූ වත්කම් සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳවද විගණනයට කිසිඳු විස්තරයක් ඉදිරිපත් නොවුණි. | තොරතුරු නොමැත. | මෙම පවරා ගැනීමට අදාළ නඩු තීන්දු පිටපත් හා ලේඛනගත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඒ) අංක අමප/22/2180/616/034 හා 2023 ජනවාරි 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සංස්ථාව මාස 06ක කාලයක් තුළ ඈවර කිරීමට තීරණය කර තිබුණද ඇල්පිටියේ පිහිටි මෙම ෆෝම් රබර් කර්මාන්තශාලාව මෙතෙක් බදුදීමට කටයුතු නොකිරීම හා ගිණුම් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව ඈවර කිරීම තවදුරටත් ප්‍රමාද තත්ත්වයේ පැවතුණි. | ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාවේ යන්ත්‍ර සූත්‍ර අලෙවි කිරීම සඳහා අංක අමප/23/0225/616/006 හා 2023.03.08 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් තීරණයන් වෙනුවට අදාළ ලෝහ වර්ග වෙන් වෙන් වශයෙන් වර්ග කර අලෙවි කිරීම දක්වා වූ සම්පූර්ණ ක්‍රියාවලිය කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත පැවරීමටත්, එම ලෝහ වර්ග අලෙවි කිරීමෙන් පසු සීමාසහිත රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට ලැබෙන මුදල් | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සංස්ථාව ඈවර කිරීමේ කටයුතු සිදු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීමටත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. එසේම සංස්ථාවේ 2011/2012 වසරේ සිට 2022/2023 වසර දක්වා අවසාන ගිණුම් සෑදීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, සංස්ථාව ඈවර කිරීම සඳහා ඈවරකරුවෙකුද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පත් කරගනිමින් ඈවර කිරීමට අදාළ කටයුතු කරනු ඇත. | |
| (ඔ) 1995 මාර්තු 06 දින "ශ්‍රී ලංකා රබර් මැනියුෆැක්චරින් ඇන්ඩ් එක්ස්පෝට් කොපරේෂන් ලිමිටඩ්" නමින් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ මෙම සංස්ථාව සංස්ථාගත කර ඇති අතර 2007 අංක 07 දරන නව සමාගම් පනත යටතේ 2009 ඔක්තෝබර් 27වන දින නැවත ලියාපදිංචි කර ඇතත් එම සහතිකය සංස්ථාව සතුව නොතිබුණි. එමෙන්ම සමාගම් පනතේ නියමයන් අනුව 2009 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික වාර්තා හා ගිණුම් ප්‍රකාශන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වේ. | 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූල විය යුතුය. |
| (ඕ) විවිධ අමාත්‍යාංශ යටතට පත්ව පැවති මෙම සංස්ථාව අංක 1933/13 හා 2015 සැප්තැම්බර් 21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත් වී ඇති අතර දැනට අකර්මන්‍යව පවතින රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව මගින් යථෝක්ත කර්මාන්තශාලා තුන බදු දී තිබුණි. වර්තමානයේදී කර්මාන්තශාලාවල බදු මුදල් එකතු කරනු ලබන්නේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් වන අතර මෙහි කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් නොව 2010 වර්ෂයේ සිට නිසිබලධාරියෙකු මගින් ඉටු කෙරේ. කෙසේවුවද සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව නිසිපරිදි ප්‍රමාණවත් අධීක්ෂණයකට ලක් වී නොමැති බැවින් වර්තමානය වන විට එම සංස්ථාව සඳහා යොදවා ඇති සම්පත් නිෂ්කාර්යය වී ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය. | ඈවර කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. | 2023 ජනවාරි 31 දිනැති අංක අමප/22/2180/616/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සංස්ථාව ඈවර කිරීම් කටයුතු කළ යුතු වේ. |